## 1. *මලින්ද සෙනෙවිරත්න එ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව*[1]

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2019-06-27 දින තොරතුරු අයදුම්පත්‍ර දෙකක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරියා වෙත යොමු කර තිබුණි. පළමු අයදුම් පත්‍රයේ පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටියේය.

*බන්ධනාගාර පනතේ වගන්ති 94 යටතේ පනවා ඇති රීති හා රෙගුලාසි ඇත්නම් ඒවාද ඇතුලුව මරණ දණ්ඩනය නියමව සිටින රැඳවියන්ට හා මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සියලු රීති හා රෙගුලාසි*

අනෙකුත් තොරතුරු ඉල්ලීම මගින් අභියාචක විසින් පහත තොරතුරු ඉල්ලා තිබුණි.

2. *බන්ධනාගාර දෙපාර්තමේන්තුව හෝ එහි සිටින වෙනත් නිලධාරියකු හට අතිගරු ජනාධිපති විසින් හෝ වෙනත් පුද්ගලයකු විසින් කුමන හෝ සිරකරුවෙකුට එරෙහිව මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සිදු කරන්නේ කවදාද සහ/හෝ කුමන ස්ථානයේද යන්න අදාලව යොමු කරන ලද උපදෙස් සහ/හෝ නියෝග සහ/හෝ දැනුම් දීම් සහ/හෝ ලියවිලි ලැබී ඇත්ද යන්න.*
3. *එසේ ලැබී ඇත්නම්,*

    *අ) එසේ යොමුකරන ලද උපදෙස්වල සහ/හෝ නියෝගවල සහ/හෝ දැනුම් දීම්වල සහ/හෝ ලියවිලිවල වල පිටපතක්.*

    *ආ) ඉහත සඳහන් කරන ලද මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට නියමිත බන්ධනාගාරය සහ/හෝ මධ්‍යස්ථානය සහ/හෝ ස්ථානය?*

    *ඇ) කුමන දිනයක හෝ වෙලාවකද?*

    *ඈ) කුමන රැඳවියන්ට එරෙහිවද?*

    *ඉ) ඒ පිළිබඳව අදාල රැඳවියන් ලිඛිතව දැනුවත් කරනු ලැබ ඇත්තේද, එසේ කලා නම් ඒ කවදාද?*
4. *මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයන් බඳවාගැනීම සිදුකොට ඇත්තේද?*
5. *එසේ බඳවා ගැනීම සිදු කලා නම්*

    *අ) කුමන දිනකදීද?*

    *ආ) නිලධාරීන් කී දෙනෙකු බඳවා ගත්තේද?*

    *ඇ) කුමන නිලයක් යටතේද, තනතුර හෝ ශ්‍රේණිය?*

---

[1] RTIC APPEAL (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1492/2019- 2019-07-02 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය

*ඈ) එම නිලධාරීන් හට කුමන පුහුණුවක් ලබා දී ඇත්තේද?*

*ඉ) එම කුමන හෝ නිලධාරියකු විසින් මරණ දණ්ඩනය පැනවීම සිදුකිරීම හෝ එවැනි අවස්ථාවකට සහභාගී වීම මෙයට පෙර සිදු කොට ඇත්තේද?*

රුදවියන් හතර දෙනෙකුට එරෙහිව වහාම මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරන බවටත් තමා මේ වන විට ඒ සඳහා අදාල ලියකියවිලි සඳහා අත්සන් කොට ඇති බවටත් අතිගරු ජනාධිපති විසින් සිදුකරන ලද ප්‍රසිද්ධ ප්‍රකාශය මත පදනම්ව අදාල රුදවියන්ගේ ජීවිතය හා පුද්ගල නිදහසට බලපෑමක් මෙමගින් ඇතිකරන බවට විශ්වාස කරන බැවින් අභියාචක විසින් තමා ඉල්ලා සිටින තොරතුරු පැය 48 ක් ඇතුලත ලබා දෙන ලෙස ඉල්ලා සිට තිබුණි.

මෙම කාරණය පුදගලයන් කිහිප දෙනෙකුගේ ජීවිතය හා පුද්ගල නිදහස හා සම්භන්ධ කාරණයක් වන බැවින් අභියාචක විසින් 2019-07-01 වන දින විද්‍යුත් තැපැල හරහා අභියාචනය එක එල්ලේම කොමිෂන් සභාව වෙත යොමු කොට තිබුණි. ගාස්තු හා අභියාචනා හා ක්‍රියා පටිපාටි පිළිබඳ කොමිෂන් සභාවේ රීති 13 (2) (ගැසට් අංක 2004/66- 03-02-2017) යටතේ අභියාචනයක් පුද්ගලයකු විසින් පැමිණ භාර දීම හෝ ලියාපදිංචි තැපැල මගින් කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදුකල යුතු නමුත් අභියාචනය වෙත අදාල කාරණය වෙත කඩිනම් අවධානය ලබාදිය යුතු නිසාත් මෙම අභියාචනය මගින් ඉල්ලා සිටි තොරතුරු RTIC Appeal 1491/2019 දරණ අභියාචනයට අදාල කරුණ පිළිබඳම වූ හෙයින් මෙම අභියාචනය RTIC Appeal 1491/2019 දරණ අභියාචනය සමග 2019-07-02 වන දින එකට සලකා බැලීමට තීරණය කරනු ලැබුවේය. තවද, මෙම අභියාචනයේ සන්දර්භය අනුව අධිකරණ අමාත්‍යාංශයද අදාළ පොදු අධිකාරියක් බවට විද්‍යාමාන වූ හෙයින් මෙම අභියාචනයද, මෙසේ එකවර සලකා බැලීමට සුදුසු බවට නිරීක්ෂණය විය.

කෙසේ නමුදු, 2016 අංක 12 දරණ තොරතුරු ලබාගැනීමේ අයිතිය පිළිබඳ පනතේ වගන්ති 31 (1) ට අනුව අභියාචනය නම් කල නිලධාරියා වෙත වර්තාමය වශයෙන් යොමු කල යුතු බවට ඇති අවශතාවය පිළිබඳව අභියාචකව දැනුවත් කිරීම සිදුකරනු ලැබුවේය. ඒ අනුව අදාල පොදු අධිකාරියේ නම් කල නිලධාරියා හට තම තොරතුරු ඉල්ලීමට අදාලව අභියාචනයක් යොමු කරන ලෙසත්, තොරතුරු ඉල්ලීම පුරවැසියන්ගේ ජීවිතය හා පුද්ගල නිදහස සම්භන්ධයෙන් වන බැවින් පැය 48 ඇතුලත තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලෙසටත් කොමිෂන් සභාව විසින් අභියාචකට උපදෙස් දෙනු ලැබුවේය.

**අභියාචනය සලකා බැලීමේදී උද්ගත වූ කරුණු**

මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරන බවට ජනපති විසින් කරන ලද නිවේදනයට අදාල සිරකරුවන් හතර දෙනාගේ නම් තම දෙපාර්තමේන්තුව සතුව නොමැති බවත්, නමුත් මත්ද්‍රව්‍ය හා සම්භන්ධ වැරදිවලට අසුව මරණ දණ්ඩනය නියමව සිටින සිරකරුවන් විසි දෙනෙකුගේ නම් අමාත්‍යාංශය හරහා ජනපති වෙත යොමු කල බවට වගඋත්තරකරු වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනීසිටීමට බලයලත් නිලධාරියා විසින් ප්‍රකාශ කොට සිටියේය.

අදාල රැඳවියන්ගේ පුද්ගලිකතවයට හානිකර බලපෑමක් ඇතිවිය හැකි බැවින් ඉල්ලා සිටින සිටින ලද තොරතුරු ලබාදීම අර්බුධකාරී වියහැකි බව ටත් ඔහු විසින් ප්‍රකාශ කලේය. එසේම, රැඳවියන්ගේ කැමැත්ත ලබා ගැනීමකින් තොරව එම තොරතුරු ලබාදීමට තමා අපොහොසත් වූ බවටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම වගන්ති 24(5) (ඇ) ට අදාලව පැහැදිලි කිරීමක්ද විමසා සිටියේය.

> *යම් තැනැත්තෙකුගේ ජීවිතය ආරක්‍ෂා කර ගැනීම හෝ නිදහස ආරක්‍ෂා කර ගැනීම ගැනීම සඳහා තොරතුරු අවශ්‍ය බවට විශ්වාස කරනු ලබන අවස්ථාවක දී, එම විශ්වාස කිරීම පිළිබඳ පදනම ඇතුලුව ඒ සඳහා වූ ප්‍රකාශයක් ඇතුලත් කළ යුතුය.*

තමා ඉල්ලා සිටි තොරතුරු පුද්ගලයකුගේ ජීවිතය හා පුද්ගල නිදහස ආරක්‍ෂා කිරීමට අත්‍යාවශ්‍ය බවට විශ්වාසකිරීමට හේතු වූ පදනම කුමක්ද යන්න බන්ධනාගාර දෙපාර්ත්මේන්තුව විසින් අභියාචකගෙන් විමසා සිටියේය. මත්ද්‍රව්‍ය හා සම්භන්ධ වරදවලට මරණ දණ්ඩනය නියමව සිටින පුද්ගලයන්ගේ මරණ වරෙන්තු අත්සන් කල බවට 2019-06-26 වන දින ජනාධිපති විසින් මාධ්‍ය හමුවේ කල ප්‍රකාශය මෙම තොරතුරු විශේෂයෙන්ම කඩිනම්ව ඉල්ලා සිටීමට හේතු වූ බව අභියාචක වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා විසින් ප්‍රකාශ කලේය.

තවද, අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලබා දිය නොහැකි බවත් නමුත් ලියකියවිලි පමණක් ලබාදීම සිදුකලහැකි බවටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රකාශ කලේය. මෙම ප්‍රශ්න වලට පිළිතුරු ඇතුලත් ලියකියවිලි ලබාදීමට බන්ධනාගාර දෙපාර්ත්මේන්තුවට හැකි බවට කොමිෂන් සභාවට නිරීක්‍ෂණය විය. තවද, රැඳවියන්ගේ නම් හා අනෙකුත් තොරතුරුද ලබා දීම ඔවුන්ගේ පුද්ගලිකත්වයට ප්‍රශ්නගත කාරණයක් විය හැකි බව කොමිෂන් සභාව විසින් නිරීක්‍ෂණය කලේය. කෙසේ නමුදු බන්ධනාගාර පනතේ වගන්ති 94 යටතේ පනවා ඇති රීති හා රෙගුලාසි වලට අදාල තොරතුරු ලබාදීමට එසේ වූ පුද්ගලිකත්වය පිළිබඳ වූ සලකා බැලීම් අදාල නොවේ, මේ බව පොදු අධිකාරියද පිළිගන්නා ලදී.

<u>අතුරු නියෝගය</u>[2]

පුරවැසියකුගේ ජීවිතය හා නිදහස සම්භන්ධව ඇති අවස්ථාවකදී ඒ පිළිබඳ ප්‍රකාශ කරමින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ වගන්ති 25 (3) යටතේ අයදුම් පත්‍රයක් ගොනුකිරීමෙන් ඔබ්බට කුමන ක්‍රියාපටිපාටියක් අනුගමනය කල යුත්තේද යන්න තොරතුරු දැන ගැනීමේ පනත කිසිවක් සඳහන් නොකරන බව ආරම්භයේදීම සඳහන් කල යුතුය.

වගන්ති 25 (3) මෙසේ දක්වා සිටී,

[2] 2019-07-02 වන දින දෙන ලද නියෝගය.

*තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම, යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්භන්ධයෙන් වන අවසථාවක, එම ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම, ඉල්ලීම ලැබීමෙන් පැය හතලිස් අටක් ඇතුළත කළ යුතුය.*

අදාල කාරණයේ බරපතල භාවයත් වගන්ති 25 (3) යතතේ ඇති අතුරු නියෝගයත් සලකා බලමින් මෙම පනත මගින් බලාත්මක කොට ඇති අභියාචනයේ ආනුෂංගික පියවරයන් සම්භන්ධයෙන්ද ඒ හා සමාන වැදගත්කමක් ඇති බව තර්කානුකූලව නිගමනය කල හැකිය. ඒ අනුව මෙම අභියාචනය කඩිනම් අභියාචනයක් වශයෙන් සලකා බැලීම සඳහා මෙම කොමිෂන් සභාව විසින් ලේඛනගත කිරීම සිදු කොට ඇත. ඒ අනුව මෙම අභියාචන ඒසේ වාර්තාගත කොට ඇති බවත් ඒ සම්භන්ධයෙන් පටිපාටිමය හෝ කොමිෂන් සභාවේ  බලතල පිළිබඳ විරෝධතාවයක් මෙම කරුණු සලකා බැලීමේදී පොදු අධිකාරීන් දෙදෙනා විසින්ම මතු කොට නැති බවත් තවදුරටත් වාර්තා කොට ඇත.

අභියාචකගේ පළමු තොරතුරු ඉල්ලීම සලකා බැලීමේදී, 'බන්ධනාගාර පනතේ වගන්ති 94 යටතේ පනවා ඇති රීති හා රෙගුලාසි ඇත්නම් ඒවාද ඇතුලුව මරණ දණ්ඩනය නියමව සිටින රුදවියන්ට හා මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සියලු රීති හා රෙගුලාසි' ලබා දීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව් එකගව ඇත. මෙම තොරතුරු අභියාචකට හෝ අභියාචක වෙනුවෙන් පෙනීසිටින බලයලත් නියෝජිතයෙකුට මීලග කරුණු විමසන දිනයේ හෝ පාර්ශව දෙකම එකග වන ඊට පෙර දිනයකදී ලබා දීම සිදුකිරීම සිදුකල හැක.

දෙවන තොරතුරු ඉල්ලුම්පත්‍රය සලකා බැලීමේදී, මෙය වගන්ති 5 (1) (අ) යටතේ වන පුද්ගලිකතවය පිළිබද වූ සලකා බැලීම් වලට අයත් නොවන දෙපාර්තමේන්තු නියෝග වලට අදාල වේ. තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ පනතට ප්‍රකාරව පහත සඳහන් තොරතුරු ලබා දෙන ලෙසත්, එසේ තොරතුරු ලබාදීමට නොහැකි වන්නේන්ම්, ඒ පනතේ කුමන වගන්තිය පදනම්වද යන්න කොමිෂන් සභාවේ සලකා බැලීම් උදෙසා සඳහන් කරන ලෙසද බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නියෝග කරනු ලැබේ.

6. *බන්ධනාගාර දෙපාර්තමේන්තුව හෝ එහි සිටින වෙනත් නිලධාරියකු හට අතිගරු ජනාධිපති විසින් හෝ වෙනත් පුද්ගලයකු විසින් කුමන හෝ සිරකරුවෙකුට එරෙහිව මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සිදු කරන්නේ කවදාද සහ/හෝ කුමන ස්ථානයේද යන්න අදාලව යොමු කරන ලද උපදෙස් සහ/හෝ නියෝග සහ/හෝ දැනුම් දීම් සහ/හෝ ලියවිලි ලැබී ඇත්ද යන්න.*
7. *එසේ ලැබී ඇත්නම්,*

   *අ) එසේ යොමුකරන ලද උපදෙස්වල සහ/හෝ නියෝගවල සහ/හෝ දැනුම් දීම්වල සහ/හෝ ලියවිලිවල වල පිටපතක්.*

   *ආ) ඉහත සඳහන් කරන ලද මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට නියමිත බන්ධනාගාරය සහ/හෝ මධස්ථානය සහ/හෝ ස්ථානය?*

   *ඇ) කුමන දිනයක හෝ වෙලාවකද?*

*ඈ) කුමන රැඳවියන්ට එරෙහිවද?*

*ඉ) ඒ පිළිබඳව අදාල රැඳවියන් ලිඛිතව දැනුවත් කරනු ලැබ ඇත්තේද, එසේ කලා නම් ඒ කවදාද?*

8. *මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයන් බඳවාගැනීම සිදුකොට ඇත්තේද?*
9. *එසේ බඳවා ගැනීම සිදු කලා නම්*

*අ) කුමන දිනකදීද?*

*ආ) නිලධාරීන් කී දෙනෙකු බඳවා ගත්තේද?*

*ඇ) කුමන නිලයක් යටතේද, තනතුර හෝ ශ්‍රේණිය?*

*ඈ) එම නිලධාරීන් හට කුමන පුහුණුවක් ලබා දී ඇත්තේද?*

*ඉ) එම කුමන හෝ නිලධාරියකු විසින් මරණ දණ්ඩනය පැනවීම සිදුකිරීම හෝ එවැනි අවස්ථාවකට සහභාගී වීම මෙයට පෙර සිදු කොට ඇත්තේද?*

අවශ්‍ය වන්නේනම්, පහත සඳහන්ව ඇති පනතේ 15 (ඇ) ට ප්‍රකාරව මෙම තොරතුරු රහසිගතව කොමිෂන් සභාව වෙත ලබා දීම සිදු කල හැකිය.

*මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තොරතුරු ඇතුලුව පොදු අධිකාරියක් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම*

මෙම නඩු විභාග වලදී වාර්තා වී ඇති පරිදි මත්ද්‍රව්‍ය හා සම්භන්ධ සඳහා මරණ දණ්ඩනය නියම වූ රැඳවියන් විසිදෙනෙකුගේ ලැයිස්තුවක් අමාත්‍යංශය හරහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. මෙම ලැයිස්තුව එසේම රහසිගත පරීක්ෂාකාරී කියවීම සඳහා කොමිෂන් සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කරනු ලැබේ. ව්‍යවස්ථාපිත වශයෙන් නියම කොට ඇති තම කාර්යභාරයට අනුව 5 (1) (අ) වගන්තියේ මුක්ත කිරීම් වලට යටත් නොවන තොරතුරු මුදා හැරීම සඳහා සහ වගන්ති 5 (4) යටත් වන මහජන සුභසාධනය පිළිබඳ වූ කාරණා සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් මෙම තොරතුරු ඒ අනුව සලකා බැලීම සිදුකරනු ලැබේ…...

……….අභියාචකගේ පළමු තොරතුරු ඉල්ලීම වන, 'බන්ධනාගාර පනතේ වගන්ති 94 යටතේ පනවා ඇති රීති හා රෙගුලාසි ඇත්නම් ඒවාද ඇතුලුව මරණ දණ්ඩනය නියමව සිටින රැඳවියන්ට හා මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සියලු රීති හා රෙගුලාසි' ඉල්ලාසිටීමට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මරණ දන්ඩනය නියමව සිටින රැඳවියන්ට අදාල ස්ථාවර නියෝග පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත හා අභියාචක වෙත ලබා දෙනු ලැබුවේය.

එසේම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අභියාචකගේ තොරතුරු ඉල්ලීම වූ, 'බන්ධනාගාර දෙපාර්තමේන්තුව හෝ එහි සිටින වෙනත් නිලධාරියකු හට අතිගරු ජනාධිපති විසින් හෝ වෙනත්

පුද්ගලයකු විසින් කුමන හෝ සිරකරුවෙකුට එරෙහිව මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සිදු කරන්නේ කවදා සහ/හෝ කුමන ස්ථානයේද ද යන්න අදාලව යොමු කරන ලද උපදෙස් සහ/හෝ නියෝග සහ/හෝ දැනුම් දීම් සහ/හෝ ලියවිලි ලැබී ඇත්ද' යන්න සලකා බලමින් ලිපියක් ලබා දෙන ලදී. එම ලිපියේ අයිතම 1 හා 2 සම්භන්ධයෙන් ප්‍රතිචාර ලෙස, මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සම්භන්ධයෙන් හෝ අයිතම 1 හෝ 2 සම්භන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සිදු කිරීමට අදාල කිසිදු ලිඛිත නියෝගයක් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව පොදු අධිකාරිය විසින් තහවුරු කරනු ලැබුවේය. පොදු අධිකාරිය විසින් දෙනු ලැබූ ප්‍රතිචාරය පිළිබඳ තමා තෘප්තිමත් බවට අභියාචක ප්‍රකාශ කලේය.

අයිතම තුන හා හතර සම්භන්ධයෙන්, මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා පුදගලයන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට බඳවාගත්තේද යන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින්, පොදු අධිකාරිය එසේ කල බවට ප්‍රකාශ කරනු ලැබූ අතර මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සිදු කිරීම සඳහා දෙදෙනෙකු එම තනතුරට බඳවාගෙන ඇති බවට 2019-07-08 දිනැති ලිපිය තහවුරු කලේය. තවද, ඔවුන් මීට පෙර කිසිම අවස්ථාවකදී මරණ දණ්ඩනය පැනවීම සිදුකිරීම හෝ එවැනි අවස්ථාවකට සහභාගී වීම සිදු කොට නොමැති බව ප්‍රකාශ කර සිටියේය.

2019-07-02 වන දින කොමිෂන් සභාව විසින් RTIC Appeal 1491/ 2019 දරණ අභියාචනයට අදාලව නිකුත් කල නියෝගයට අනුව හා අභියාචනයට ප්‍රතිචාර වශයෙන් මත්ද්‍රව්‍ය හා සම්භන්ධ වැරදි වලට වරදකරුවන් වී ඇති රැඳවියන්ගෙන් තමන්ගේ නම් හෙළිදරව් කිරීමට කැමැත්ත දක්වන්නේද යන්න අදහස් විමසා සිටීමේදී රැඳවියන් හත් දෙනෙකු තම නම් හෙළිදරව් කිරීමට කැමැත්ත දක්වා ඇති බව පොදු අධිකාරිය ප්‍රකාශ කොට ඇත. මත්ද්‍රව්‍ය හා සම්භන්ධ වැරදි වලට වරදකරුවන් 18 දෙනෙකු සිටින බවත් ඔවුන් මේ වන විට බන්ධනාගාර තුනක එනම්, වැලිකඩ, අගුණකොලපැලැස්ස සහ දුම්බර යන ස්ථාන වල සිටින බවත් පොදු අධිකාරිය ප්‍රකාශ කර සිටියේය. කෙසේ නමුදු මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා කුමන රැදිවියන් හතර දෙනා තෝරාගෙන ඇත්තේද යන්න තමන් දැනුවත් කිරීම සිදුකල නොකල බව පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරියා නැවතත් තහවුරු කරනු ලැබුවේය.

**නියෝගය[3]**

මත්ද්‍රව්‍ය හා සම්භන්ධ අපරාධ වලට වරදකරුවන් වී මරණ දණ්ඩනය නියමව සිටින රැඳවියන් සියල්ලන්ගේ නම් ඇතුලත් ලැයිස්තුවෙන් නම් හෙළිදරව් කිරීමට අවසරය ලබා නොදුන් රැදිවියන්ගේ නම් ඉවත්කරන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නියෝග කරනු ලැබේ. රැඳවියන්ගේ පුද්ගලිකභාවයට ඇති අයිතිය මහජන සුභසාධනය සඳහා ඇතිවන බලපෑම සමගින් තුලනය කිරීමේදී, තමන්ගේ තොරතුරු හෙළිදරව් කිරීමට කැමැත්ත ලබා දී ඇති රැඳවියන්ගේ පමණක් නම් සහ නඩුකරයනගේ තොරතුරු අභියාචක හට ලබාදීම ප්‍රමාණවත් වන බව අප විසින් නිගමනය කරනු ලැබේ.

---

[3] 2019-07-09 වන දින දෙන ලද නියෝගය.

මෙසේ නිගමනය කරනු ලබන්නේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ වගන්ති 5 (1) (අ) වගන්ති 5 (4) සමග එකට කියවීම මගිනි.

5 (1) (අ) යටතේ පහත සඳහන් තොරතුරු හෙළිකිරීම මුක්ත කරයි

*පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්භන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදුවේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැතත ලබා දී ඇතනම් මිස*

5 (4) මෙසේ සඳහන් කරයි

*(1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතුය*

ඒ අනුව, නම් හෙළිදරව් කිරීමට කැමැත්ත දක්වා ඇති අයගේ පමණක් තොරතුරු හෙළිදරව් කිරීම මහජන සුභසාධනය පිළිබඳ ඇති අවශතාවය සපුරාලීමට ප්‍රමාණවත් බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනයේ අභියාචකටත් RTIC Appeal 1491/2019 දරණ අභියාචනයේ අභියාචකටත් තොරතුරු හෙළිදරව් කිරීමට කැමැත්ත ලබා නොදුන් රැඳවියන්ගේ නම් ඉවත් කර නැවත සකස්කරන ලද නම් ඇතුලත් ලැයිස්තුවේ පිටපතක් ලබා දෙන ලෙස නියෝග කරනු ලැබේ.

තවදුරටත්, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් නම් ලබාදිය හැකි රැඳවියන්ගේ නඩු අංක හා නඩු තීන්දු ලබා දුන් දිනයන් ඇතුලත් ලැයිස්තුවක් ලබා දී ඇත. මෙම අභියාචන දෙකම එකට සලකා බැලීම සිදුකරන බැවින් එම ලැයිස්තුවද මෙම අභියාචනයේ අභියාචකටත් RTIC Appeal 1491/2019 දරණ අභියාචනයේ අභියාචකටත් ලබා දීම සිදුකල හැකිය.

ජනාධිපති විසින් මෑතකදී කල නිවේදනය මගින් සඳහන් කල ආකාරයට මත්ද්‍රව්‍ය හා සම්භන්ධ අපරාධවලට අසුව මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට නියමිත රැඳවියන් හතර දෙනෙකුගේ තොරතුරු ජනාධිපති විසින් තමන් හට දන්වා නොමැති බව පොදු අධිකාරිය තහවුරු කර ඇත. එනිසා එම රැඳවියන් හතර දෙනාගේ තොරතුරු පනතේ වගන්ති 03 දක්වන ආකාරය අනුව පොදු අධිකාරිය "සතුව, භාරයේ හෝ පාලනයට නතුව" නොපවතින බව කොමිෂන් සභාව තීරණය කරනු ලැබේ. තවද, මරණ වරෙන්තු ලබා සිටින රැඳවියන්ට අදාල රීති හා රෙගුලාසි සහ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරන්නන් ලෙස බඳවාගත්තවුන් පිළිබඳව ඉල්ලා සිටින තොරතුරු වලට පොදු අධිකාරිය විසින් තොරතුරු සපයන ලද බැවින් මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.